ව්‍යවහාරික තාක්ෂණවේදය = තේ කර්මාන්තය (සි) 6 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

# ව්‍යවහාරික තාක්ෂණවේදය
# තේ කර්මාන්තය
## කඳුකරයට ගොඩ බැස්ස ආගන්තුකයා



## ගුරු මාර්ගෝපදේශය
## 6 ශ්‍රේණිය

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ව්‍යවහාරික තාක්ෂණවේදය

# තේ කර්මාන්තය

## කඳුකරයට ගොඩ බැස්ස ආගන්තුකයා

## ගුරු මාර්ගෝපදේශය

## 6 ශ්‍රේණිය

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ව්‍යවහාරික තාක්ෂණවේදය
තේ කර්මාන්තය - 6 ශ්‍රේණිය
කඳුකරයට ගොඩ බැස්ස ආගන්තුකයා

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය - 2025

© ජාතික අධ්‍යාපන ආයතනය

සියලු ම හිමිකම් ඇවිරිණි

ISBN –

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.ac.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
.........................................................................
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත්කරන ලදී.

## හැඳින්වීම

2024 වසරේ සිට ක්‍රියාත්මක වන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් ශිෂ්‍ය හැකියා සහ ළැදියාවන්ට ගැළපෙන ආකාරයට වඩාත් ප්‍රායෝගික ව ඉගෙනීමට අවස්ථාව ලබා දේ. ඒ සඳහා භෞතික සම්පත් මෙන් ම මානව සම්පත් සංවර්ධනය කිරීම එක සේ වැදගත් වේ. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ අධ්‍යාපනය ලබන දරුවෙකුගෙන් අපේක්ෂිත අධ්‍යාපන අභිමතාර්ථවලට සාර්ථක ව ළඟා වීම සඳහා 21 වන සියවසට ගැළපෙන සේ ගුරු භූමිකාව සංවර්ධනය වීම ඉතා වැදගත් වේ. අපේක්ෂිත ඉගෙනුම් කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රමය තුළ 21 වන සියවසට අවශ්‍ය නිපුණතා අත් පත් කර ගත හැකි පරිදි සුතථ්‍ය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමත් එය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම සැකසීමත් මෙමගින් අපේක්ෂා කෙරෙයි.

මෙහි දී සෑම ක්‍රියාකාරකමක් අතරතුර දී ම සිදු කරන ගුරු තක්සේරුව තුළින් (සම්භවන තක්සේරුව) 70% ක ලකුණු ප්‍රමාණයක් ද, මොඩියුලය අවසානයේ දී සිදුකරන තක්සේරුව තුළින් (සම්පිණ්ඩිත තක්සේරුව) 30%ක ලකුණු ප්‍රමාණයක් ද ඔබට හිමි වේ.

**නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ අධ්‍යාපනය ලබන දරුවෙකුගෙන් අපේක්ෂිත අධ්‍යාපන අභිමතාර්ථ**

1. තිරසර ජාතික සංවර්ධනයට සක්‍රිය ව දායක වන පුද්ගලයකු බිහිකිරීම
   (An active contributor to sustainable national development )

2. ඵලදායි හා කාර්යක්ෂම වැඩ නැඹුරු පුරවැසියෙකු, සේවකයෙකු හෝ ස්වයං රැකියාලාභියකු බිහි කිරීම
   (An effective and efficient work-oriented citizen employee or self employee )

3. ව්‍යවසායකයෙකු සහ/හෝ ව්‍යවසායකත්ව මනෝභාවයකින් යුතු පුරවැසියකු තැනීම.
   (An entrepreneur and or a person with entrepreneurial mindset)

4. දේශප්‍රේමී පුරවැසියෙකු ගොඩනැගීම
   (A patriotic citizen)

5. යහපත් මිනිසකු නිර්මාණය කිරීම
   (A good human being )

6. ප්‍රීතිමත් පවුලක සාමාජිකයෙකු තැනීම
   (Member of a happy family)

මීට අමතරව සිසුන් තුළ 21 වන සියවසට අදාළ පහත සඳහන් කුසලතා ප්‍රගුණ කිරීම ද අපේක්ෂා කෙරේ.

**ඉගෙනුම් කුසලතා**

- ★ විචාරාත්මක සිතීමේ හැකියාව
- ★ සහයෝගීව කටයුතු කිරීමේ හැකියාව
- ★ සන්නිවේදන හැකියාව
- ★ නිර්මාණශීලීබව

**සාක්ෂර කුසලතා**

- ★ තොරතුරු සාක්ෂරතාව
- ★ මාධ්‍ය සාක්ෂරතාව
- ★ තාක්ෂණ සාක්ෂරතාව

**ජීවන කුසලතා/ පෞරුෂ ගති ලක්ෂණ**

- ★ නම්‍යශීලීතාවය
- ★ නායකත්වය
- ★ ආරම්භක ශක්තිය
- ★ ඵලදායීතාව
- ★ සමාජශීලීබව

මෙම මොඩියුලයේ ඇති විවිධ ක්‍රියාකාරකම් ඉහත සඳහන් කුසලතා වර්ධනය වන ආකාරයට සැලසුම් කර ඇත. එම එක් එක් ක්‍රියාකාරකම මඟින් සංවර්ධනය කිරීමට අපේක්ෂිත ගුණාංග මෙහි සඳහන් සලකුණ මඟින් දක්වා ඇත.

## ස්වයං තක්සේරුව හා සමපදස්ථ තක්සේරුව

මොඩියුලයේ ඇතුළත් ක්‍රියාකාරකම්වල නිරත වීමෙන් අනතුරුව අපේක්ෂිත අරමුණු ඉටු වී ඇත් දැයි මැන ඔවුන්ට ම තමන්ගේ හැකියා මැන බැලීමට ස්වයං තක්සේරුව අත්වැලක් වනු ඇත. ඔවුන්ට තමන්ගේ හැකියා පිළිබඳ ස්වයං විවරණයක යෙදීමට ද අවස්ථාව ලැබේ. සමපදස්ථ තක්සේරුව මඟින් සම වයසේ මිතුරන් ඇගයීම හා සමාලෝචනය මඟින් සිසුන්ට ඔවුන්ගේ වැඩකටයුතු සම්බන්ධයෙන් එකිනෙකා විවේචනය කිරීමට හා ප්‍රතිපෝෂණ සැපයීමට අවස්ථාව ලැබේ. මෙමඟින් සිසුන්ගේ ජීවන කුසලතා වර්ධනය කර ගැනීමට උපකාර වේ. ස්වයං තක්සේරුවෙන් හා සමපදස්ථ තක්සේරුවෙන් ඔවුන්ගේ දැනුම හා හැකියාව අඩු බව හැඟීයාමෙන් මන්දෝත්සාහී වීමට නොදී සිසුන් දිරිමත් කරන්න. සිසුන් ස්වයං හා සමපදස්ථ තක්සේරුවල නිරත වීමේ දී, අවශ්‍ය අවස්ථාවල තීරණ ගැනීම සඳහා ඔවුන්ට සහාය වන්න.

## කාලය

මෙම මොඩියුලය හැදෑරීම සඳහා පැය 10 ක් ලැබේ. මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් පාසලේ දී මෙන් ම නිවසේ දී ද කළ යුතු බැවින් ඒ සඳහා නිශ්චිත වශයෙන් කාලච්ඡේද වෙන් කිරීම අසීරු ය. එක් එක් ශිෂ්‍යයාට තමන්ට අවස්ථාව ලැබෙන පරිදි මෙහි සඳහන් ක්‍රියාකාරකම්වල නිරත විය හැකි ය. නමුත් මොඩියුලයේ ඇති එක් එක් ක්‍රියාකාරකම සඳහා කාලය වෙන් කළ හැකි යෝජිත සැලැස්මක් මෙහි දක්වා ඇත. එය ඔබගේ අවශ්‍යතාව හා එක් එක් අවස්ථාවලට වඩාත් ගැළපෙන පරිදි වෙනස් කර ගැනීමේ නිදහස ඔබ සතු ය.

## උපදේශනය, රචනය හා සංස්කරණය

උපදේශකත්වය : මහාචාර්ය මංජුලා විතානපතිරණ (PhD)
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

: කේ රංජිත් පත්මසිරි මයා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

අධීක්ෂණය : ආචාර්ය කේ.ජී. වසන්ත කටුකුරුන්ද මයා
අධ්‍යක්ෂ තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය

සම්බන්ධීකරණය : ආචාර්ය එල්. ඩබ්. ආර්. ද අල්විස් මිය (විශ්‍රාමික)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව

: පී. නිපුන පෙරේරා මයා
සහකාර කථිකාචාර්ය, තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ලේඛක මණ්ඩලය : තාරකා සමාලි සේනාරත්න මිය
ශ්‍රී ලංකා ගුරු සේවය, බප/පිළි/ කොතලාවලපුර මහා විද්‍යාලය

: ඩබ්ලිව්. ඒ. එම්. ශිහාරා වික්‍රමආරච්චි මිය
ශ්‍රී ලංකා ගුරු සේවය, මප/හැ/ ගිනිගත්හේන මධ්‍ය විද්‍යාලය

සංස්කරණය
අභ්‍යන්තර : පී. නිපුන පෙරේරා මයා
සහකාර කථිකාචාර්ය, තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

බාහිර : යජිත් ද සිල්වා මයා
ප්‍රධාන මෙහෙයුම් නිලධාරි, ශ්‍රී ලංකා පාම් ඔයිල් කර්මාන්ත සංගමය

: ආනන්ද ප්‍රනාන්දු මයා
අධ්‍යක්ෂ, මස්කෙළිය, කැගල්ල, නමුණුකුළ වැවිලි සමාගම

භාෂා සංස්කරණය: මනෝරී ස්වර්ණපාලී මිය
ශ්‍රී ලංකා ගුරු සේවය, බප/හෝ/සීතාවක ජාතික පාසල

පිටකවරය හා :
පිටු සැකසීම

## පටුන


| | |
|---|---|
| පටුන | vii |
| හැඳින්වීම | iii |
| ස්වයං තක්සේරුව සහ සමපදස්ථ තක්සේරුව | iv |
| කාලය | iv |
| පොදු උපදෙස් | 1 |
| මොඩියුල හැඳින්වීම | 3 |

# පොදු උපදෙස්

● සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදයෙන් බැහැර ව සූතත්‍ය ඉගෙනුමට සිසුන් යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙහි දී ගුරුවරයා නිරන්තරයෙන් සෑම සිසුවෙකු කෙරෙහි ම අවධානය යොමු කරමින් පහසුකම් සපයන්නෙක් වශයෙන් කටයුතු කළ යුතු වේ.

● මොඩියුලයේ දැනුම තහවුරු කර ගැනීම සඳහා එක් එක් පරිච්ඡේදයේ ඇති සියලු ම ක්‍රියාකාරම් අදාළ උපදෙස් අනුව සිදු කරන්න.

● එක් එක් ක්‍රියාකාරකම කිරීමට ප්‍රථම ඒ සඳහා අවශ්‍ය සංකල්ප පිළිබඳව ඔබේ සහාය ඇතුව අධ්‍යයනය කරන්න.

● ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

● නියමිත කාලය තුළ ක්‍රියාකාරකම්වල නිරත කරවීමත් පසු ක්‍රියාකාරකම් සඳහා සිසුන් මෙහෙයවීමත් වැදගත් වේ.

● නියමිත කාලය තුළ ක්‍රියාකාරකම්වල නිරත කරවීමත් පසු ක්‍රියාකාරකම් සඳහා සිසුන් මෙහෙයවීමත් වැදගත් වේ.

● 21 වන සියවසේ කුසලතා සංවර්ධනය වීමට අවස්ථා සැලසිය යුතු වන අතර හැකි තරම් නව තාක්ෂණික මෙවලම් උපයෝගී කර ගැනීමට හා අන්තර්ජාල භාවිතයෙන් හා වෙනත් මූලාශ්‍ර ඔස්සේ තොරතුරු සෙවීමට යොමු කළ යුතු වේ. ඉගෙනුම් ක්‍රියාවලියේ දී අතිරේක පොත් පරිශීලනය සහ අන්තර්ජාලය භාවිතය සඳහා අවශ්‍ය පාරිභාෂික වචන මාලාව මොඩියුලය ආරම්භයේ දක්වා ඇත. මෙම මොඩියුලය තුළ අවශ්‍ය තොරතුරු ඉතා පහසුවෙන් හා කාර්යක්ෂම ව ලබා ගැනීමේ මූලාශ්‍ර යොමුවන් (QR Code) ලබා දී ඇත. ඒ සඳහා යොමු වීමට නම් තාක්ෂණික උපකරණ භාවිතයට වැඩිහිටියන්ගේ සහායත් අනුදැනුමත් යටතේ සිදු කළ යුතු බව සිසුන් දැනුවත් කරන්න.

● සිසුන් විසින් සිදු කරන ක්‍රියාකාරම්වල වාර්තා සිසුන් විසින් සම්පූර්ණ කරන ලේඛන ගොනුවට (Portfolio) එකතු කරන්න.

● එක් ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කර ක්‍රියාකාරකම් 01 සඳහා අවශ්‍ය අධ්‍යයන කොටස් ආවරණය කරන්න.

● තොරතුරු ලබා ගැනීමේ දී අදාළ පුද්ගලයන් සමඟ ගනුදෙනු කිරීම වැඩිහිටියෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කරවන්න.

● පසු ක්‍රියාකාරම්වලට අදාළ ඉදිරිපත් කිරීම් සඳහා සුදුසු නිශ්චිත කාල වකවානුවක් ලබා දෙන්න.

● මෙහි සඳහන් ඇතැම් ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් පාසලේ දී අත්දැකීම් ලබා ගැනීමට ඔබේ සහාය ලබා දෙන්න. එම ක්‍රියාකාරකම් වඩාත් සාර්ථක ව සිදු කිරීමට සහ නිරීක්ෂණය සඳහා අදාළ ස්ථානවලට හෝ ආයතන වල අත්දැකීම් ලබා ගැනීමට ක්ෂේත්‍ර චාරිකා සංවිධානය සඳහා දෙමාපිය සහාය ලබා ගන්න.

●ක්‍රියාකාරී ව ඉගෙන ගන්නෙකු ලෙස මෙහි යෝජනා කර ඇති ස්වයං ක්‍රියාකාරකම් සහ කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සාර්ථක ව නිරත ව ඒ ඇසුරෙන් ස්වයං තක්සේරුවේ (Self Assessment) සහ සමපදස්ථයින් තක්සේරුවේ (Peer Assessment) නිරත වන්නට උපදෙස් ලබා දෙන්න.

● අපේක්ෂිත ප්‍රවීණතා මට්ටමට ඔවුන් ළඟා වූයේ දැයි සොයා බැලීම සඳහා සුතත්‍ය තක්සේරුව සිදු කරමින් අවශ්‍ය අවස්ථාවල දී ප්‍රතිපෝෂණ සහ ඉදිරි පෝෂණ සැපයීම ද කළ යුතු වේ.

● සිසුන්ට සුවිශේෂී වූ නව සොයාගැනීම් හා නව ක්‍රම උපයෝගී කර ගනිමින් ආර්ථික වශයෙන් වටිනාකම් සහිත නව නිපැවුම් හෝ සේවා බිහිකිරීමේ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය සඳහා ඔවුන් ව යොමු කළ යුතු වේ.

● ඔබගේ කුසලතා වර්ධනයට අවශ්‍ය දේ මෙම මොඩියුලය යටතේ ඉගෙන ගත හැකි ය. ඒ ඇසුරෙන් ඔබට නිර්මාණ සිදු කළ හැකි ය. එම නිසා, මෙම මොඩියුලය මඟින් ඉගෙන ගන්නෙකු ලෙස ඔබට ඔබේ හැකියාවන් හා අදාළ කුසලතා සාර්ථක කර ගැනීමට මහඟු උපකාරයක් සපයනු ලබයි.

## මොඩියුලය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වැවිලි බෝගයක් වන තේ මෙරටට විදේශ විනිමය රැගෙන එන මාර්ග අතර ප්‍රධාන ස්ථානයක් ගනියි. තේ වගාව පිළිබඳ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කෙරෙන ක්‍රමික සාකච්ඡා මාලාවේ පළමුවන පියවර ''කඳුකරයට ගොඩ බැස්ස ආගන්තුකයා'' ලෙස මෙම ප්‍රකාශනය එළි දැක් වේ. මෙම මොඩියුලයේ විෂය නිර්දේශයට අදාළ අන්තර්ගත ඒකක, යෝජිත කාලච්ඡේද, ඉගෙනුම් පල හා පන්ති කාමරයේ දී සහ නිවසේ දී කළ යුතු ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලින් සමන්විත වේ. තේ වගාවේ මූලික කරුණු පිළිබඳ අවබෝධයක් ලබා දීමට මෙම මොඩියුලයේ දී අවධානය යොමු කර ඇත. තේ වගාවට බලපාන හිතකර තත්ත්වයන්, තේ ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ සහ රටවල් මෙන් ම තේ කෝප්පයක් පිළියෙල කිරීම වැනි සරල විෂය කොටස් මෙහි දී සාකච්ඡා කෙරේ. විදේශ වෙළඳ පොළේ වැඩි ඉල්ලුමක් පවතින අගය එකතු කළ තේ නිෂ්පාදන පිළිබඳ සංකල්පය ශිෂ්‍යයන් වෙත සමීප කරවීමෙන් විදේශ වෙළඳ පොළේ ඇති තරගකාරීත්වයට අභියෝගයක් එල්ල කළ හැකි ව්‍යවසායකයෙකු බිහි කිරීමේ මූල බීජය රෝපණය කර ඇත. ශ්‍රී ලංකාවේ තේ වගාව හා සම්බන්ධ රැකියා පිළිබඳ සාකච්ඡා කිරීමෙන් රැකියා වියුක්තියට පිළියමක් යෙදීමට හැකි වෙතැයි අපේක්ෂා කෙරේ.

**මෙම මොඩියුලය පහත සඳහන් ඒකකවලින් සමන්විතය.**

1. තේ දල්ලේ කතන්දරේ
2. එන්න අපි තේ හදමු
3. කොහේද මේ තේ වවන්නේ ?

**මෙම මොඩියුලය සාර්ථක ව හැදෑරීමෙන් සිසුන්ට**

1. අනෙකුත් ශාක අතුරින් තේ ශාකය වෙන් කර හඳුනා ගැනීම සඳහා එහි ස්වාභාවය, රූප විද්‍යාත්මක ලක්ෂණ සහ උද්භිද විද්‍යාත්මක ලකෂණ ගවේෂණය කිරීමට

2. ශ්‍රී ලංකාවේ හා ලෝකයේ තේ වගාව සඳහා වඩාත් උචිත ප්‍රදේශ හා රටවල් හඳුනා ගැනීමට, තේ වගාව සඳහා යෝග්‍ය ප්‍රශස්ත දේශගුණික සාධක විමර්ශනය කිරීමට

3. කළු තේ හා අගය එකතු කළ තේ පානයන් පිළියෙල කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණය, අවශ්‍ය ද්‍රව්‍ය, උපකරණ හා ද්‍රව්‍ය භාවිත කිරීමට

4. තේ පානයෙන් ලැබෙන සෞඛ්‍යමය ප්‍රතිලාභ පිළිබඳ ගවේෂණය කිරීමට

හැකියාව ලැබෙනු ඇත.

# 1. තේ දල්ලේ කතන්දරේ

**ඉගෙනුම් පලය :**

★අනෙකුත් ශාක අතුරින් තේ ශාකය වෙන් කර හඳුනා ගැනීම සඳහා එහි ස්වාභාවය, රූප විද්‍යාත්මක ලක්ෂණ සහ උද්භිද විද්‍යාත්මක ලක්ෂණ ගවේෂණය කරයි.

**කාර්ය සාධන ප්‍රමිතීන් :**

- තේ ශාකයේ කොටස් ගවේෂණය කරයි.
- තේ ශාකයේ ව්‍යුහය හා කොටස් හඳුනා ගෙන රූප සටහන් අඳියි.
- තේ ශාකයේ ඉංග්‍රීසි නාමය, කුලය හා නිජබිම ප්‍රකාශ කරයි.
- තේ ශාකයේ ඉතිහාසය විස්තර කරයි.

**පාඩම පිළිබඳව කෙටියෙන් :**

සිසුන් සුනත්‍ය ඉගෙනුම සඳහා පහත සඳහන් මාතෘකා ඔස්සේ පෙළ ගස්වා ඇත. එනම්,

- තේ ශාකයේ කොටස් හඳුන්වා දීමට
- තේ ශාකයේ විද්‍යාත්මක තොරතුරු හඳුන්වා දීමට
- තේ ශාකයේ ඉතිහාසය හඳුනා ගැනීමට

ඉහත මාතෘකා ඔස්සේ තොරතුරු අධ්‍යයනය සඳහා සිසුන් යොමු කරන්න.

**මොඩියුලය ක්‍රියාත්මක කිරීමේ දී,**

- සිසුන් කණ්ඩායමක් ලෙස ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස් ලබා දෙන්න.
- අවශ්‍ය තොරතුරු ගවේෂණය සඳහා දී ඇති අන්තර්ජාල සබැඳි (links) භාවිත කිරීමට සිසුන් දැනුවත් කරන්න.
- ක්‍රියාකාරකම සඳහා යොදා ගත හැකි කාලය පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- ක්‍රියාකාරකමෙහි නිරත කරවීම සහ අවසානයේ සොයාගත් තොරතුරු පන්ති කාමරයට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

## පාඩම් සැලැස්ම :

| කාලය | ක්‍රියාකාරකම් අංකය | සිසු කාර්ය | ගුරු කාර්ය | සම්පත් ද්‍රව්‍ය/ සටහන් |
|---|---|---|---|---|
| මිනි.50 | පූර්ව ක්‍රියාකාරකම | ■ මොඩියුලය ආරම්භයේ දී ඇති QR code භාවිත කර දී ඇති වීඩියෝව නැරඹීම.<br><br>■ මේ සඳහා වැඩිහිටි සහාය හා උපදෙස් ලබා ගැනීම.<br><br>■ අදාළ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.<br><br>■ 6 පිටුවෙහි සඳහන් ගීතය රංගනයක් සමඟ ඉදිරිපත් කිරීම. | ■ ඉගෙනුම් ක්‍රියාවලියට ප්‍රවේශ වීමට පෙර දරුවා ලබා ගන්නා ඉගෙනුම් අන්තර්ගතය පිළිබඳව මෙමගින් අදහසක් ලබා දීම.<br><br>■ දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයමින් තේ වගාව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට උපදෙස් ලබා දීම.<br><br>■ මේ සඳහා ඔබට සොයා ගත හැකි තවත් ගීත හා වීඩියෝ පට භාවිත කිරීම.<br><br>■ තාක්ෂණික උපකරණ භාවිතය වැඩිහිටියන්ගේ සහායත් අනුදැනුමත් යටතේ කිරීමට උපදෙස් ලබා දීම.<br><br>■ සිසුන් කණ්ඩායම් කර හෝ ඒකල වශයෙන් 6 පිටුවෙහි සඳහන් ගීතය රංගනයක් සමඟ ඉදිරිපත් කිරීමට අදාළ උපදෙස් ලබා දීම. | Smart board, Tab හෝ smart phone |
| පැය 01 මිනි.40 | ක්‍රියාකාරකම 1.1 | ■ නිවසින් හෝ අවට පරිසරයෙන් සොයා ගත් තේ ශාකයේ විවිධ කොටස්වල සජීවී නිදර්ශක/ පොත්, පුවත් පත්, අන්තර්ජාලය ඔස්සේ රැස් කරගත් ඡායාරූප/ පින්තූර ජායාරූප පන්තියට රැගෙන ඒම.<br><br>■ තේ ශාකයේ විවිධ කොටස් දී ඇති හිස්තැන්වල ඇඳ දැක්වීම.<br><br>■ තේ ශාකයේ ඉතිහාසය පිළිබඳ කතා පුවත නැරඹීම. | ■ තේ වගාවක් සිදු කරන ක්ෂේත්‍රයක් නැරඹීමට සිසුන්ට අවස්ථාව සලසා දීම.<br><br>■ ක්‍රියාකරකම 01 සිදු කිරීමට අවශ්‍ය සජීවී නිදර්ශක, ජායාරූප හා එයට අවශ්‍ය අනෙක් ද්‍රව්‍යය පන්තියට රැගෙන ආ යුතු බව ක්‍රියාකාරකම කිරීමට පෙර දැනුවත් කිරීම.<br><br>■ තේ ශාකයේ විවිධ කොටස් දී ඇති හිස්තැන්වල ඇඳ දැක්වීමට අදාළ උපදෙස් ලබා දීම. | අන්තර්ජාල සබැඳි භාවිත ය. පුවත්පත් පොත්පත්, සඟරා ආදිය |

| | | | | |
|---|---|---|---|---|
| | | ■ මේ සඳහා වැඩිහිටි සහාය හා උපදෙස් ලබා ගැනීම.<br><br>■ තේ ශාකයේ ඉතිහාසය පිළිබඳ කතා පුවත නිර්මාණාත්මක ව පන්තියට ඉදිරිපත් කිරීම. | ■ ඉහත සඳහන් නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දීම.<br><br>■ තේ ශාකයේ ඉතිහාසය පිළිබඳ වැඩිදුර කරුණු රැස් කර ගැනීමට දී ඇති යොමුව ඔස්සේ ලබා ගත හැකි බව සිසුන් දැනුවත් කිරීම.<br><br>■ තොරතුරු ගවේෂණය සඳහා දී ඇති අන්තර්ජාල සබැඳි (links) භාවිත කිරීමට සිසුන් දැනුවත් කිරීම.<br><br>■ තාක්ෂණික උපකරණ භාවිතය වැඩිහිටියන්ගේ සහායත් අනුදැනුමත් යටතේ කිරීමට උපදෙස් ලබා දීම.<br><br>■ ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.<br><br>■ සිසුන් විසින් සොයා ගත් කරුණු සාකච්ඡා කිරීම.<br><br>■ මෙම ක්‍රියාකාරකම සිදු කිරීමෙන් ප්‍රදර්ශනය කරන නිපුණතාවය ඇගයීමක් ලෙස තක්සේරුකරණය සිදු කරන බව සිසුන් දැනුවත් කිරීම.<br><br>■ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉදිරි හා ප්‍රතිපෝෂණ ලබා දීම.<br><br>■ සෑම සිසුවෙක් සඳහා ම වාර්තා සටහන් තබා ගැනීම. | |
| මිනි.50 | ක්‍රියාකාරකම 1.2 | ■ තොරතුරු ගවේෂණය සඳහා දී ඇති අන්තර්ජාල සබැඳි (links) භාවිත කිරීම.<br><br>■ මේ සඳහා වැඩිහිටි සහාය හා උපදෙස් ලබා ගැනීම. | | අන්තර්ජාලය පොත්පත්, සඟරා |

| | | | | |
|---|---|---|---|---|
| | | ■ මේ සඳහා වැඩිහිටි සහාය හා උපදෙස් ලබා ගැනීම.<br><br>■ තේ ශාකයේ ඉතිහාසය පිළිබඳ කතා පුවත නිර්මාණාත්මක ව පන්තියට ඉදිරිපත් කිරීම. | ■ ඉහත සඳහන් නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දීම.<br><br>■ තේ ශාකයේ ඉතිහාසය පිළිබඳ වැඩිදුර කරුණු රැස් කර ගැනීමට දී ඇති යොමුව ඔස්සේ ලබා ගත හැකි බව සිසුන් දැනුවත් කිරීම.<br><br>■ තොරතුරු ගවේෂණය සඳහා දී ඇති අන්තර්ජාල සබැඳි (links) භාවිත කිරීමට සිසුන් දැනුවත් කිරීම.<br><br>■ තාක්ෂණික උපකරණ භාවිතය වැඩිහිටියන්ගේ සහායත් අනුදැනුමත් යටතේ කිරීමට උපදෙස් ලබා දීම.<br><br>■ ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.<br><br>■ සිසුන් විසින් සොයා ගත් කරුණු සාකච්ඡා කිරීම.<br><br>■ මෙම ක්‍රියාකාරකම සිදු කිරීමෙන් ප්‍රදර්ශනය කරන නිපුණතාවය ඇගයීමක් ලෙස තක්සේරුකරණය සිදු කරන බව සිසුන් දැනුවත් කිරීම.<br><br>■ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉදිරි හා ප්‍රතිපෝෂණ ලබා දීම.<br><br>■ සෑම සිසුවෙක් සඳහා ම වාර්තා සටහන් තබා ගැනීම. | |
| මිනි.50 | ක්‍රියාකාරකම 1.2 | ■ තොරතුරු ගවේෂණය සඳහා දී ඇති අන්තර්ජාල සබැඳි (links) භාවිත කිරීම.<br><br>■ මේ සඳහා වැඩිහිටි සහාය හා උපදෙස් ලබා ගැනීම. | | අන්තර්ජාලය පොත්පත්, සඟරා |

| | | | | |
|---|---|---|---|---|
| | | ■ තේ ශාකයේ උද්භිද විද්‍යාත්මක ලක්ෂණවලට අදාළ කරුණු අන්තර්ජාලය සහ පුස්තකාලය ඇසුරින් සොයා හිස්තැන් සම්පූර්ණ කිරීම.<br><br>■ නිජබිම, කුලය සහ විශේෂ ලක්ෂණ සඳහන් කළ කරුණු ඇතුළත් පෝස්ටරයක් නිර්මාණය කර පන්තියට ඉදිරිපත් කිරීම. | ■ තේ ශාකයේ උද්භිද විද්‍යාත්මක ලක්ෂණවලට අදාළ කරුණු අන්තර්ජාලය සහ පුස්තකාලය ඇසුරින් සොයා හිස්තැන් සම්පූර්ණ කිරීමට අදාළ උපදෙස් ලබා දීම.<br><br>■ නිජබිම කුලය සහ විශේෂ ලක්ෂණ සඳහන් කළ කරුණු ඇතුළත් පෝස්ටරයෙහි නිර්මාණශීලීභාවය හා අදාළ කරුණුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම.<br><br>■ තොරතුරු ගවේෂණය සඳහා දී ඇති අන්තර්ජාල සබැඳි (links) භාවිත කිරීමට සිසුන් දැනුවත් කිරීම.<br><br>■ තාක්ෂණික උපකරණ භාවිතය වැඩිහිටියන්ගේ සහායත් අනුදැනුමත් යටතේ සිදු කිරීම.<br><br>■ නිර්මාණය කරන ලද පෝස්ටරයේ අදාළ කරුණු ඇතුළත් කර තිබේ දැයි ඇගයීම.<br><br>■ ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.<br><br>■ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉදිරි හා ප්‍රතිපෝෂණ ලබා දීම.<br><br>■ සෑම සිසුවකු සඳහා ම වාර්තා සටහන් තබා ගැනීම.<br><br>■ සිසුන් විසින් සොයා ගත් කරුණු සාකච්ඡා කිරීම.<br><br>■ මෙම ක්‍රියාකාරකම සිදු කිරීමෙන් ප්‍රදර්ශනය කරන නිපුණතාවය ඇගයීමක් ලෙස තක්සේරුකරණය සිදු කරන බව සිසුන් හට දැනුවත් කිරීම. | |

| නිර්ණායක | තක්සේරුව | | | | ලකුණු |
|---|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 | |
| තේ ශාකයේ කොටස් පිළිබඳ අවබෝධය | තේ ශාකයේ කොටස් 6 ක් නිවැරදි ව ඇඳ දක්වයි. | තේ ශාකයේ කොටස් 4 ක් ඇඳ දක්වයි. | තේ ශාකයේ කොටස් 2 ක් ඇඳ දක්වයි. | ගුරුවරයාගේ සහාය ඇති ව තේ ශාකයේ කොටස් කිහිපයක් ඇඳ දක්වයි. | |
| තේ ශාකයේ උද්භිද විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ අවබෝධය | තේ ශාකයේ උද්භිද විද්‍යාත්මක ලක්ෂණ 5 ක් ලියා දක්වයි. | තේ ශාකයේ උද්භිද විද්‍යාත්මක ලක්ෂණ 3 ක් ලියා දක්වයි. | තේ ශාකයේ උද්භිද විද්‍යාත්මක ලක්ෂණ 2 ක් ලියා දක්වයි. | තේ ශාකයේ උද්භිද විද්‍යාත්මක ලක්ෂණ ගුරුවරයාගේ සහාය ඇති ව ලියා දක්වයි. | |
| තේ ශාකයේ ඉතිහාසය පිළිබඳ අවබෝධය | තේ වගාවේ ඉතිහාසය සම්බන්ධ සම්පූර්ණ කතා පුවත නිර්මාණාත්මක ලෙස ඉදිරිපත් කරයි. | තේ වගාවේ ඉතිහාසය සම්බන්ධ සම්පූර්ණ කතා පුවත ඉදිරිපත් කරයි. | තේ වගාවේ ඉතිහාසය සම්බන්ධ කතා පුවතින් කොටසක් ඉදිරිපත් කරයි. | තේ වගාවේ ඉතිහාසය සම්බන්ධ කතා පුවත ගුරුවරයාගේ සහාය ඇති ව ඉදිරිපත් කරයි. | |
| තොරතුරු ඉදිරිපත් කිරීමේ නිර්මාණාත්මකභාවය | වර්ණ සංකලන හා රූප සටහන් කරමින් ආකර්ෂණීය ලෙස තොරතුරු ඉදිරිපත් කර ඇත. | වර්ණ සංකලන හා රූප සටහන් කරමින් ආකර්ෂණීය ලෙස තොරතුරු ඉදිරිපත් කර ඇත. | ආකර්ෂණීය ලෙස තොරතුරු ඉදිරිපත් කර ඇත. | ආකර්ෂණීය ලෙස තොරතුරු ඉදිරිපත් කිරීම සංවර්ධනය විය යුතු ය. | |
| මුළු ලකුණු | | | | | |

**1.සංවර්ධනය විය යුතු ය. 2. සෑහීමකට පත් විය හැකි ය. 3.සතුටුදායකයි 4.ඉතා සතුටුදායකයි.**

# 2. එන්න අපි තේ හදමු.

**ඉගෙනුම් පලය :**

- කළු තේ හා අගය එකතු කළ තේ පානයක් පිළියෙල කිරීමට යෝග්‍ය තාක්‍ෂණය, අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය භාවිත කරයි.

**කාර්ය සාධන ප්‍රමිතීන් :**

- තේ කෝප්පයක් පිළියෙල කිරීමට අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය සොයා බලා ඉදිරිපත් කරයි.
- තේ කෝප්පයක් පිළියෙල කිරීමට අවශ්‍ය තේ කොළ, ජල ප්‍රමාණය හා උණු ජලයේ ප්‍රශස්ත උෂ්ණත්වය නිර්ණය කරයි.
- යෝග්‍ය විවිධ ද්‍රව්‍ය එකතු කරමින් අගය එකතු කළ කළු තේ පාන පිළියෙල කරයි.

**පාඩම පිළිබඳව කෙටියෙන් :**

සිසුන් සුතත්‍ය ඉගෙනුම සඳහා පහත සඳහන් මාතෘකා ඔස්සේ පෙළ ගස්වා ඇත. එනම්,

- තේ පානයක් පිළියෙල කිරීම
- අගය එකතු කළ තේ පානයන් පිළියෙල කිරීම

**මොඩියුලය ක්‍රියාත්මක කිරීමේ දී,**

- සිසුන් තනි ව හෝ කණ්ඩායමක් ලෙස ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස් ලබා දෙන්න.
- අවශ්‍ය තොරතුරු ගවේෂණය සඳහා තේ වගාකරුවන්, ක්ෂේත්‍ර නිලධාරීන්ගේ අදහස් විමසන්න.
- අවශ්‍ය තොරතුරු ගවේෂණය සඳහා දී ඇති අන්තර්ජාල සබැඳි (links) භාවිත කිරීමට සිසුන් දැනුවත් කරන්න.
- ක්‍රියාකාරකම සඳහා යොදා ගත හැකි කාලය පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- ක්‍රියාකාකාරකමෙහි නිරත කරවීම සහ අවසානයේ සොයාගත් තොරතුරු පන්ති කාමරයට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

## පාඩම් සැලැස්ම

| කාලය | ක්‍රියාකාරකම් අංකය | සිසු කාර්ය | ගුරු කාර්ය | සම්පත් ද්‍රව්‍ය/ සටහන් |
|---|---|---|---|---|
| මිනි.50 | ක්‍රියාකාරකම 2.1 | ■ තේ සෑදීමට අවශ්‍ය උප කරණ සහ සාම්පල රැගෙන ඒම.<br><br>■ තේ සෑදීමේ දී භාවිතයට ගන්නා උණු වතුර භාවිත කිරීමේ දී සැලකිලිමත් වීම.<br><br>■ විවිධ ආකාරයේ තේ සාම්පල පිළියෙල කිරීම ඒවායේ රස පිළිබඳව මිතුරන් සමඟ සාකච්ඡා කර වගුව සම්පූර්ණ කිරීම.<br><br>■ නිවැරදි ව තේ පානය ක් සාදා ගන්නා ආකාරය පිළිබඳව මොඩියුලයේ දී ඇති කරුණු හතර ඔස්සේ ගුරුභවතා සමඟ සාකච්ජා කිරීම.<br><br>■ සාදාගත් තේ පානය නිර්මාණාත්මක ව පන්තිය ඉදිරියේ පිළිගැන්වීම.<br><br>■ තේ සාම්පලවල රසයන් සංසන්දනය කිරීම.<br><br>■ සියලු ම තේ සාම්පල වලින් තේ පිළියෙල කර ඒවායේ රසයන් හා තේ පාන පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කිරීම. | ■ තේ සෑදීමට අවශ්‍ය උපකරණ සහ සාම්පල රැගෙන එන ලෙස පෙර දවසේ සිසුන් ව දැනුවත් කිරීම.<br><br>■ විවිධ ආකාරයේ තේ සාම්පල පිළියෙල කිරීමට සිසුන්ට මග පෙන්වීම.<br><br>■ ඒවායේ රස පිළිබඳව මිතුරන් සමඟ සාකච්ඡා කර වගුව සම්පූර්ණ කිරීමට මග පෙන්වීම.<br><br>■ නිවැරදි ව තේ පානයක් සාදා ගන්නා ආකාරය පිළිබඳව මොඩියුලයේ දී ඇති කරුණු හතර ඔස්සේ සිසුන් සමඟ සාකච්ජාවක් ගොඩ නැගීම.<br><br>■ සාදාගත් තේ පානය නිර්මාණාත්මක ව පන්තිය ඉදිරියේ පිළිගැන්වීමට සිසුන් යොමු කිරීම.<br><br>■ තේ සාම්පලවල රසයන් සංසන්දනය කිරීමට සිසුන්ට සහාය වීම.<br><br>■ සියලු ම තේ සාම්පලවලින් තේ පිළියෙල කර ඒවායේ රසයන් හා තේ පාන පිළිබඳ පෝස්ටරයක් නිර්මාණාත්මක ව නිර්මාණය කිරීමට උපදෙස් ලබා දීම.<br><br>■ කරුණු ඇතුළත් පෝස්ටරයෙහි නිර්මාණශීලීභාවය හා අදාළ කරුණුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම.<br><br>■ ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.<br><br>■ සිසුන් විසින් සොයා ගත් කරුණු සාකච්ජා කිරීම. | |

| | | | | |
|---|---|---|---|---|
| | | | ■ මෙම ක්‍රියාකාරකම සිදු කිරීමෙන් ප්‍රදර්ශනය කරන නිපුණතාවය ඇගයීමක් ලෙස තක්සේරුකරණය සිදු කරන බව සිසුන් දැනුවත් කිරීම.<br><br>■ ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව ඉදිරි හා ප්‍රතිපෝෂණ ලබා දීම.<br><br>■ සෑම සිසුවකු සඳහා ම වාර්තා සටහන් තබාගැනීම. | |
| මිනි.50 | ක්‍රියාකාරකම 2.2 | ■ තේ පානයේ අගය වැඩි කිරීම සඳහා යොදාගත හැකි ද්‍රව්‍ය ගෙන ඒම.<br><br>■ එම එක් එක් ද්‍රව්‍ය යොදා තේ පාන සකස් කර ගැනීම.<br><br>■ එම එක් එක් සාම්පලයන්හි විවිධ රස හඳුනා ගනිමින් වගුව පිරවීම. | ■ තේවල අගය වැඩි කිරීම සඳහා යොදාගත හැකි ද්‍රව්‍ය පිළිබඳව සිසුන් දැනුවත් කරමින් එම ද්‍රව්‍ය රැගෙන එන ලෙස ක්‍රියාකාරකමට පෙර දින සිසුන් ව දැනුවත් කිරීම.<br><br>■ සිසුන් රැගෙන ආ ද්‍රව්‍ය භාවිත කර විවිධ රසයෙන් යුත් තේ පාන සකස් කර ගැනීමට සිසුන්ට මග පෙන්වීම.<br><br>■ එම එක් එක් සාම්පලයන්හි විවිධ රස හඳුනා ගනිමින් වගුව පිරවීම සඳහා සිසුන්ට මග පෙන්වීම.<br><br>■ ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.<br><br>■ සිසුන් විසින් සොයා ගත් කරුණු සාකච්ඡා කිරීම.<br><br>■ මෙම ක්‍රියාකාරකම සිදු කිරීමෙන් ප්‍රදර්ශනය කරන නිපුණතාවය ඇගයීමක් ලෙස තක්සේරුකරණය සිදු කරන බව සිසුන් දැනුවත් කිරීම.<br><br>■ ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව ඉදිරි හා ප්‍රතිපෝෂණ ලබා දීම.<br><br>■ සෑම සිසුවකු සඳහා ම වාර්තා සටහන් තබා ගැනීම. | අන්තර්ජාල සබැඳි භාවිත ය.<br><br>තේ සෑදීමට අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| පැය 01 මිනි.40 | ක්‍රියාකාරකම 2.3 | ■ තොරතුරු ගවේෂණය සඳහා දී ඇති අන්තර්ජාල සබැඳි (links) භාවිත කිරීමට සිසුන් දැනුවත් කිරීම.<br>■ තාක්ෂණික උපකරණ භාවිතය වැඩිහිටියන්ගේ සහායත් අනුදැනුමත් යටතේ සිදු කිරීම.<br>■ දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම හා අන්තර්ජාලය හෝ පොත්පත් ගවේෂණය කර තේ හා බැඳුණු සෞඛ්‍යමය ප්‍රතිලාභ පිළිබඳව කුඩා පොත් පිංචක් සකස් කිරීම. | ■ තොරතුරු ගවේෂණය සඳහා දී ඇති අන්තර්ජාල සබැඳි (links) භාවිත කිරීමට සිසුන් දැනුවත් කිරීම.<br>■ තාක්ෂණික උපකරණ භාවිතය වැඩිහිටියන්ගේ සහායත් අනුදැනුමත් යටතේ සිදු කිරීමට සිසුන් දැනුවත් කිරීම.<br>■ කරුණු ඇතුළත් කුඩා පොත් පිංචෙහි නිර්මාණශීලීභාවය හා අදාළ කරුණුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම.<br>■ ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.<br>■ සිසුන් විසින් සොයා ගත් කරුණු සාකච්ඡා කිරීම.<br>■ මෙම ක්‍රියාකාරකම සිදු කිරීමෙන් ප්‍රදර්ශනය කරන නිපුණතාවය ඇගයීමක් ලෙස තක්සේරුකරණය සිදු කරන බව සිසුන් දැනුවත් කිරීම.<br>■ ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව ඉදිරි හා ප්‍රතිපෝෂණ ලබා දීම.<br>■ සෑම සිසුවකු සඳහා ම වාර්තා සටහන් තබා ගැනීම. | |

| නිර්ණායක | තක්සේරුව | | | | ලකුණු |
|---|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 | |
| තේ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සපයා ගැනීම. | තේ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සියල්ල ම සපයා ගෙන ඇත. | තේ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ කොටසක් සපයා ගෙන ඇත. | තේ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ කිහිපයක් සපයා ගෙන ඇත. | තේ සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ සපයා ගෙන ඒමට උත්සාහ දරා ඇත. | |
| තේ සෑදීමේ නිවැරදි පියවර අනුගමනය කිරීම. | තේ සෑදීමේ දී අනුගමනය කරන පියවර සියල්ල ම නිවැරදි වේ. | තේ සෑදීමේ දී අනුගමනය කරන පියවර දෙකක් නිවැරදි වේ. | තේ සෑදීමේ දී අනුගමනය කරන පියවර එකක් නිවැරදි වේ. | තේ සෑදී-මේ දී අනුග මනය කරන පියවර සියල්ල ම වැරදි වේ. | |
| අගය එකතු කළ තේ සාම්පලවල රස හඳුනා ගැනීම. | තේ සාම්පල සියල්ලගේ ම රස නිවැරදි ව හඳුනා ගනියි. | තේ සාම්පල හයක රස නිවැරදි ව හඳුනා ගනියි. | තේ සාම්පල හතරක රස නිවැරදි ව හඳුනා ගනියි. | තේ සාම්පල දෙකක රස නිවැරදි ව හඳුනා ගනියි. | |
| තේ සෑදීමේ එක් එක් පියවරවල වැදගත්කම හඳුනා ගැනීම. | තේ සෑදීමේ පියවර සියල්ලගේ ම වැදගත්කම විස්තර කරයි. | තේ සෑදීමේ පියවර දෙකක වැදගත්කම විස්තර කරයි. | තේ සෑදීමේ එක් පියවරක වැදගත්කම විස්තර කරයි. | තේ සෑදීමේ කිසිදු පියවරක වැදගත්-කම විස්තර නොකරයි. | |
| තේ පිළිගැන්වීමේ නිර්මාණාත්මක-භාවය. | සුදුසු කෝප්පයක් භාවිත කර බන්දේසියක තබා නිර්මාණාත්මක ක්‍රමවේදයන් භාවිත කර තේ පිළිගන්වයි. | සුදුසු කෝප්පයක් භාවිත කර බන්දේසියක තබා තේ පිළිගන්වයි. | සුදුසු කෝප්පයක් භාවිත කර තේ පිළිගන්වයි. | තේ පිළිනොගන්වයි. | |
| මුළු ලකුණු | | | | | |

1.සංවර්ධනය විය යුතු ය. 2. සෑහීමකට පත් විය හැකි ය. 3.සතුටුදායකයි 4.ඉතා සතුටුදායකයි.

# 3. කොහේ ද මේ තේ වවන්නේ ...?

**ඉගෙනුම් පලය :**

- ශ්‍රී ලංකාවේ හා ලෝකයේ තේ වගාව සඳහා වඩාත් උචිත ප්‍රදේශ හා රටවල් හඳුනා ගැනීමට තේ වගාව සඳහා යෝග්‍ය ප්‍රශස්ත දේශගුණික සාධක විමර්ශනය කරයි.

**කාර්ය සාධන ප්‍රමිතීන් :**

- තේ වගාවට බලපාන ප්‍රශස්ත දේශගුණික තත්ත්ව විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශ නම් කරයි.
- ලෝකයේ තේ වගා කරන රටවල් නම් කරයි.

**පාඩම පිළිබඳව කෙටියෙන් :**

සිසුන් සූතත්‍ය ඉගෙනුම සඳහා පහත සඳහන් මාතෘකා ඔස්සේ පෙළ ගස්වා ඇත. එනම්,

- තේ වගාවට යෝග්‍ය ප්‍රශස්ත දේශගුණික තත්ත්ව ගවේෂණය කිරීම සඳහා සිසුන් අධ්‍යයනය කිරීමට යොමු කරයි.
- ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශ
- ලෝකයේ තේ වගා කරන රටවල්

යන මාතෘකා ඔස්සේ තොරතුරු අධ්‍යයනය සඳහා සිසුන් යොමු කරන්න.

**මොඩියුලය ක්‍රියාත්මක කිරීමේ දී,**

- සිසුන් කණ්ඩායමක් ලෙස ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස් ලබා දෙන්න.
- අවශ්‍ය තොරතුරු ගවේෂණය සඳහා දී ඇති අන්තර්ජාල සබැඳි (links) භාවිත කිරීමට සිසුන් දැනුවත් කරන්න.
- ක්‍රියාකාරකම සඳහා යොදා ගත හැකි කාලය පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- ක්‍රියාකාකාරකමෙහි නිරත කරවීම සහ අවසානයේ සොයාගත් තොරතුරු පන්ති කාමරයට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පාඩම් සැලැස්ම :

| කාලය | ක්‍රියාකාරකම් අංකය | සිසු කාර්ය | ගුරු කාර්ය | සම්පත් ද්‍රව්‍ය/ සටහන් |
|---|---|---|---|---|
| මිනි.50 | ක්‍රියාකාරකම 3.1 | ■ තොරතුරු ගවේෂණය සඳහා දී ඇති අන්තර්ජාල සබැඳි (links) භාවිත කිරීම.<br>■ තාක්ෂණික උපකරණ භාවිතය වැඩිහිටියන්ගේ සහායත් අනුදැනුමත් යටතේ සිදු කිරීම.<br>■ එක් එක් අවස්ථාවේ ගුරුවරයා පවසන දිස්ත්‍රික්කය, තේ වගා කරන දිස්ත්‍රික්කයක් නම් එය පන්තිය ඉදිරියේ ඇති ලංකා සිතියමෙහි ලකුණු කිරීම.<br>■ අන්තර්ජාලය, පුස්තකාල පොත්, සිතියම් පොත් හා වැඩිහිටියකුගේ සහය ඇති ව සාම්ප්‍රදායික ව තේ වගා කරන රටවල් හා අලුතින් තේ වගාව ආරම්භ කළ රටවල් සොයා වගුවේ සටහන් කිරීම.<br>■ තේ වගාවට සුදුසු දේශගුණික තත්ත්ව හා තම ප්‍රදේශයේ යෝග්‍යතාවය සටහන් කිරීම. | ■ 01 වන ප්‍රශ්නයට අදාළ ව කණ්ඩායමකට මිතුරන් දෙදෙනෙකු බැගින් වන සේ කණ්ඩායම් සාදා ගෙන එක් එක් අවස්ථාවේ ගුරුවරයා පවසන දිස්ත්‍රික්කය, තේ වගා කරන දිස්ත්‍රික්කයක් නම් එය පන්තිය ඉදිරියේ ඇති ලංකා සිතියමෙහි ලකුණු කිරීමට උපදෙස් ලබා දීම.<br>■ අදාළ කරුණුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම.<br>■ ජයග්‍රාහි කණ්ඩායම තෝරා ගැනීම.<br>■ 02 වන ප්‍රශ්නයට අදාළ ව සාම්ප්‍රදායික ව තේ වගා කරන රටවල් හා අලුතින් තේ වගාව ආරම්භ කළ රටවල් සොයා වගුවේ සටහන් කිරීමට උපදෙස් ලබා දීම.<br>■ 02 වන ප්‍රශ්නයට අදාළ ව සාම්ප්‍රදායික ව තේ වගා කරන රටවල් හා අලුතින් තේ වගාව ආරම්භ කළ රටවල්වලට අදාළ කරුණුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම.<br>■ 03 හා 04 වන ප්‍රශ්නයට අදාළ ව තේ වගාවට සුදුසු දේශගුණික තත්ත්ව හා තම ප්‍රදේශයේ යෝග්‍යතාවය සටහන් කිරීමට උපදෙස් ලබා දීම.<br>■ 03 හා 04 වන ප්‍රශ්නයට අදාළ ව තේ වගාවට සුදුසු දේශගුණික තත්ත්ව හා තම ප්‍රදේශයේ යෝග්‍යතාවය අදාළ කරුණුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම. | සෙලෝටේප්<br>සිතියම්<br>පුස්තකාල පොත්<br>සිතියම් පොත් |

| | | | | |
|---|---|---|---|---|
| | | | ■ 05 වන ප්‍රශ්නයට අදාළ ව නිර්මාණය කරන ලද කරුණු ඇතුළත් පෝස්ටරයෙහි අදාළ කරුණු ඇතුළත් කර තිබේ දැයි ඇගයීම. නිර්මාණශීලී භාවය හා අදාළ කරුණුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම.<br><br>■ තොරතුරු ගවේෂණය සඳහා දී ඇති අන්තර්ජාල සබැඳි (links) භාවිත කිරීමට සිසුන් දැනුවත් කිරීම.<br><br>■ තාක්ෂණික උපකරණ භාවිතය වැඩිහිටියන්ගේ සහායත් අනුදැනුමත් යටතේ සිදු කිරීමට සිසුන් දැනුවත් කිරීම.<br><br>■ ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.<br><br>■ සිසුන් විසින් සොයා ගත් කරුණු සාකච්ඡා කිරීම.<br><br>■ මෙම ක්‍රියාකාරකම සිදු කිරීමෙන් ප්‍රදර්ශනය කරන නිපුණතාවය ඇගයීමක් ලෙස තක්සේරුකරණය සිදු කරන බව සිසුන් දැනුවත් කිරීම.<br><br>■ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉදිරි හා ප්‍රතිපෝෂණ ලබා දීම.<br><br>■ සෑම සිසුවකු සඳහා ම වාර්තා සටහන් තබා ගැනීම. | |
| | පසු ක්‍රියාකාරකම | ■ වැඩිහිටියෙකුගේ සහය ඇති ව ඔබ ප්‍රදේශයේ තේ වගාව හා සබැඳි රැකියා අවස්ථා සහ ග්‍රාමීය රැකියා නියුක්තිය පිළිබඳ දත්ත ලැයිස්තුගත කිරීම.<br><br>■ දත්ත ප්‍රස්තාරයක් මඟින් තනි ව හෝ කණ්ඩායමක් ලෙස පන්තියට ඉදිරිපත් කිරීම. | ■ තොරතුරු පහත සඳහන් ස්ථානවලින් ලබා ගැනීමට මඟ පෙන්වීම.<br><br>තේ සමිති<br><br>ග්‍රාමසේවක කාර්යාලය | |

| | | | | |
|---|---|---|---|---|
| | පසු ඇගයුම | ■ මොඩියුලය අවසානයේ ලබා දී ඇති පසු පරීක්ෂණයට තනිව ම පිළිතුරු සැපයීම. | ■ මොඩියුලය අවසානයේ ලබා දී ඇති පසු පරීක්ෂණයට තනිව ම පිළිතුරු සපයා මිතුරන් සමඟ පිළිතුරු සාකච්ඡා කිරීමට උපදෙස් ලබා දීම.<br><br>■ ඒ ඇසුරෙන් ස්වයං ඇගයීමේ නිරත වීමට සිසුන්ට මග පාදා දීම. | |

| නිර්ණායක | තක්සේරුව | | | | ලකුණු |
|---|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 | |
| ශ්‍රී ලංකාවේ තේ වැවෙන ප්‍රදේශ හා ලෝකයේ තේ වැවෙන රටවල් පිළිබඳ තොරතුරු රැස් කිරීම. | තොරතුරු සියල්ල ම රැස් කර ඇත. | තොරතුරු සැලකිය යුතු ප්‍රමාණයක් රැස් කර ඇත. | තොරතුරු සුලු ප්‍රමාණයක් රැස් කර ඇත. | තොරතුරු ගුරුවරයාගේ සහය ඇති ව රැස් කරයි. | |
| ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශ හා ලෝකයේ තේ වගා කරන රටවල් සිතියම් ගත කිරීම. | තේ සෑදීමේ දී අනුගමනය කරන පියවර සියල්ල ම නිවැරදි වේ. | තේ සෑදීමේ දී අනුගමනය කරන පියවර දෙකක් නිවැරදි වේ. | තේ සෑදීමේ දී අනුග මනය කරන පියවර එකක් නිවැරදි වේ. | තේ සෑදීමේ දී අනුගමනය කරන පියවර සියල්ල ම වැරදි වේ. | |
| තේ වගා කරන ප්‍රදේශ අනුව තේ වගාවට ගැළපෙන දේශගුණික තත්ත්ව පිළිබඳ අවබෝධ කර ගැනීම. | තේ වගාවට ගැළපෙන දේශගුණික තත්ත්වයන් සියල්ල ම ලියා ඇත. | තේ වගාවට ගැළපෙන දේශගුණික තත්ත්වයන් තුනක් ලියා ඇත. | තේ වගාවට ගැළපෙන දේශගුණික තත්ත්වයන් දෙකක් ලියා ඇත. | තේ වගාවට ගැළපෙන දේශගුණික තත්ත්වයක් ලියා ඇත. | |
| තමා ජීවත් වන ප්‍රදේශය තේ වගාවට සුදුසු/ නුසුදුසු බව නිර්ණය කිරීම | තමා ජීවත්වන ප්‍රදේශය තේ වගාවට සුදුසු/ නුසුදුසු බවට හේතු තුනක් ඉදිරිපත් කරයි. | තමා ජීවත්වන ප්‍රදේශය තේ වගාවට සුදුසු/නුසුදුසු බවට හේතු දෙකක් ඉදිරිපත් කරයි. | තමා ජීවත්වන ප්‍රදේශය තේ වගාවට සුදුසු/ නුසුදුසු බවට හේතු එකක් ඉදිරිපත් කරයි. | තමා ජීවත්වන ප්‍රදේශය තේ වගාවට සුදුසු/ නුසුදුසු බව පවසයි. | |
| නිර්මාණාත්මක ව තොරතුරු ඉදිරිපත් කිරීම | වර්ණ සංකලන හා රූප සටහන් භාවිත කරමින් ආකර්ෂණීය ලෙස තොරතුරු ඉදිරිපත් කර ඇත. | රූප සටහන් භාවිත කරමින් ආකර්ෂණීය ලෙස තොරතුරු ඉදිරිපත් කර ඇත. | ආකර්ෂණීය ලෙස තොරතුරු ඉදිරිපත් කර ඇත. | ආකර්ෂණීය ලෙස තොරතුරු ඉදිරිපත් කිරීම සංවර්ධනය විය යුතු ය. | |
| මුළු ලකුණු | | | | | |

1.සංවර්ධනය විය යුතු ය. 2. සෑහීමකට පත් විය හැකි ය. 3.සතුටුදායකයි 4.ඉතා සතුටුදායකයි.